# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2015 මැයි මස 29 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2015.06.01 දින නිකුත් කරන ලදී)**

# සේවක අයවැය සහන දීමනා

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි.)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍යවරයා විසින් අතුරු අයවැයක් ඉදිරිපත් කරමින් 2015. 01. 29 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කරන ලද ප්‍රකාශය තුළ අඩංගු වූ පෞද්ගලික අංශයේ වැටුප් හා වේතන සඳහා එක් සේවකයකුගේ මාසික වැටුප රු. 2,500 කින් වැඩි කරන ලෙසට වූ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඇතැම් වර්ගවල සේවකයන්ට සේවා යෝජකයන් විසින් අයවැය සහන දීමනාවක් ගෙවීම සඳහා ද ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් කුමාර මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 11.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# සේවක අයවැය සහන දීමනා

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍යවරයා විසින් අතුරු අයවැයක් ඉදිරිපත් කරමින් 2015. 01. 29 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී කරන ලද ප්‍රකාශය තුළ අඩංගු වූ පෞද්ගලික අංශයේ වැටුප් හා වේතන සඳහා එක් සේවකයකුගේ මාසික වැටුප රු. 2,500 කින් වැඩි කරන ලෙසට වූ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඇතැම් වර්ගවල සේවකයන්ට සේවා යෝජකයන් විසින් අයවැය සහන දීමනාවක් ගෙවීම සඳහා ද ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.** පූර්විකාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2015 අංක        දරන සේවකයින්ගේ අයවැය සහන දීමනා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, (මෙහි මින්මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2015 මැයි මස 1 වන දින සිට එය ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. ලුහුඬු නාමය.

2. (1) මේ පනතේ කාර්යය සඳහා කොමසාරිස්වරයා නිසි බලධරයා වන්නේ ය. නිසි බලධරයා.

(2) මේ පනතින් බලධරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කටයුත්තක් හෝ කාර්යයක් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියකු වෙත ඒ බලධරයා විසින් පවරනු ලැබිය හැකි ය.

3. (1) 2015 මැයි මස 1 වන දින සිට බලපවත්වන පරිදි යම් කර්මාන්තයකම සහ ඕනෑම සේවාස්නයකට සෑම සේවා යෝජකයකු විසින් ම, මාසික මූලික වැටුප රුපියල් හතලිස් දහස නොඉක්මවන එක් එක් සේවකයාට එක් එක් මාසය වෙනුවෙන් "අයවැය සහන දීමනාව" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන රුපියල් දෙදහස් පන්සියකට නොඅඩු දීමනාවක් අදාළ දින සිට ගෙවනු ලැබිය යුතු ය. අයවැය දීමනා ගෙවීම.

2—PL 009063—325 (2015 /05)

එසේ වුව ද:

(අ) ඒ සේවායෝජකයා තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයෙහි හෝ රබර් වැවීමේ සහ නිෂ්පාදන කිරීමේ කර්මාන්තයෙහි හෝ කොකෝවා, කරඳමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයෙහි හෝ පොල් වැවීමේ කර්මාන්තයෙහි හෝ කුරුඳු හෝ දුම්කොළ කර්මාන්තයෙහි සේවායෝජකයකු වන අවස්ථාවක එක් එක් සේවකයාට ගෙවිය යුතු අයවැය සහන දීමනාව, මාසය තුළ දී ඒ සේවකයා වැඩ කර ඇති දින ගණන සඳහා වේතනය වශයෙන් ඒ සේවකයාට ගෙවිය යුතු ප්‍රමාණයෙන් සියයට විස්සක් හෝ රුපියල් දෙදහස් පන්සියය යන දෙකින් අඩු මුදල විය යුතු අතර, ඒ සේවායෝජකයා විසින් සේවයෙහි නියුක්ත කර ඇති සේවකයන් ගණන නොසලකා එම දීමනාව ගෙවිය යුතු ය; තව ද,

(ආ) එම සේවායෝජකයා සමුපකාර සමිතියක් වන අවස්ථාවක එම සමුපකාර සමිතිය විසින් සේවයෙහි නියුක්ත කර ඇති සේවකයින් ගණන නොසලකා අයවැය සහන දීමනාව ගෙවිය යුතුව ඇත. අනියම් සේවකයින් සම්බන්ධයෙන් වූ විට එම දීමනාව ඔහු ඒ මාසය තුළ වැඩ කර ඇති දින ගණනේ අනුපාතය අනුව විය යුතු ය.

(2) කෑලි ප්‍රමාණය අනුව හෝ දින ප්‍රමාණය අනුව හෝ ගෙවීමේ පදනම මත සේවකයකු සේවයෙහි නියුක්ත කර ඇති අවස්ථාවක මේ පනත යටතේ ගෙවිය යුතු අයවැය සහන දීමනාවල අවස්ථාවෝචිත පරිදි, කෑලි ප්‍රමාණය අනුව හෝ දින ප්‍රමාණය අනුව හෝ ගෙවීමේ පදනම මත ඔහුට ගෙවිය යුතු වේතනයෙන් සියයට විස්සකට නොඅඩු මුදලක් විය යුතු ය. එසේවුවද වුවත් මේ උපවගන්තිය යටතේ ගෙවිය යුතු ප්‍රමාණය මාසයකට රුපියල් දෙදහස් පන්සියය නොඉක්මවිය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අයවැය සහන දීමනාව-

(අ) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16 අ වගන්තිය යටතේ අනුමත පුණ්‍යායතනයක් වශයෙන් ප්‍රකාශිත ආයතනයක සේවයෙහි නියුක්තව සිටින;

(ආ) 1971 සැප්තැම්බර් මස 10 වන දින හා අංක 14,975 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ යම් සාමූහික ගිවිසුමක් පිළිබඳව කාර්මික ආරාවුල් පනතේ 10 (2) වන වගන්තිය යටතේ නියම වූ නියමයකින් ඒ සේවායෝජකයා බැඳී ඇති හා ඒ සේවායෝජකයා විසින් එබඳු යම් ගිවිසුමක් ප්‍රකාර වේතන සහ අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයක් ගෙවනු ලබන,

සේවකයකුට ගෙවනු නොලැබිය යුතු ය.

4. (අ) වෙනත් යම් ලිඛිත නීතියක, සාමූහික ගිවිසුමක හෝ වාචිකව වූ හෝ, ලිඛිත වූ හෝ ප්‍රකාශිතව වූ හෝ ගම්‍යමාන වූ හෝ යම් සේවා නියුක්ති ගිවිසුමක හෝ කුමක් සඳහන් වුව ද මේ පනතේ විධිවිධාන වලංගු සහ බල සහිත විය යුතු ය. තව ද ඒ අනුව මේ පනතේ විධිවිධාන හා ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති අවස්ථාවක, ඒ නොගැලපීමේ ප්‍රමාණය අනුව මේ පනතෙහි විධිවිධාන ඒ වෙනත් යම් නීතිය හෝ ගිවිසුම අභිබවා බලපැවැත්විය යුතු ය.

(ආ) සාමූහික ගිවිසුමක් අනුව හෝ සේව්‍ය සේවක සම්බන්ධතාවයට අදාළ වෙනයම් එකඟතාවයක් යටතේ මෙම පනත බලපැවැත්වෙන දින සිට වසරක කාලසීමාව සඳහා අදාළ වන පරිදි රුපියල් දෙදහස් පන්සියයකට වඩා නොඅඩු ප්‍රමාණයකින් මූලික වැටුප වැඩිකොට ඇති අවස්ථාවක දී, මෙම පනතේ ප්‍රතිපාදන එකී වැටුප් වැඩිවීම සිදුකරන දිනයේ සිට බල නොපැවැත්වේ.

(ඇ) සාමූහික ගිවිසුමක් අනුව හෝ සේව්‍ය සේවක සම්බන්ධතාවයට අදාළ වෙනයම් එකඟතාවයක් යටතේ මෙම පනත බලපැවැත්වෙන දින සිට වසරක කාල සීමාව සඳහා අදාළ වන පරිදි රුපියල් දෙදහස් පන්සියයකට වඩා නොවැඩි ප්‍රමාණයකින් මූලික වැටුප් වැඩිකිරීමක් සිදුකොට ඇති අවස්ථාවක දී එකී වැටුප් වැඩිවීම සිදුකරන දිනයේ සිට මෙහි දැක්වෙන වසරක කාල සීමාවට අදාළව, අදාළ මූලික වැටුප වැඩිවීමේ හා රුපියල් දෙදහස් පන්සිය අතර පරතරය අමතර දීමනාවක් ලෙස සේවකයින්ට ගෙවිය යුත්තේ ය.

(ඇ) ඉහත සඳහන් විධිවිධාන ප්‍රකාරව මූලික වැටුප් වැඩිවීමක් මෙම පනත බලපැවැත්වෙන දින සිට වසරක කාලසීමාව තුල දී සිදුවීමට නියමිත අවස්ථාවක දී එකී මූලික වැටුප් වැඩිවීම සිදුවීම දක්වා වන කාලසීමාව සඳහා රුපියල් දෙදහස් පන්සියයේ දීමනාව සම්පූර්ණයෙන් ගෙවිය යුත්තේ ය.

(ඉ) ඉහත විධිවිධාන ප්‍රකාර ගෙවිය යුතු රුපියල් දෙදහස් පන්සියයේ දීමනාව සේවකයාගේ සමස්ත සේවාකාලය පුරාවටම අදාළ වන දීමනාවක් වන අතර, එකී සේවකයාට අදාළව නීතියෙන් නියම කොට ඇති අවම වැටුපට අනිවාර්ය අතිරේකයක් විය යුතු අතර එය එලෙස මෙම පනතේ බලාත්මක දිනයෙන් පසුව බඳවාගනු ලබන සියලු සේවකයින්ගේ නෛතික අවම වැටුපට අතිරේක දීමනාවක් ලෙස ක්‍රියාත්මක විය යුතු වේ.

5. (අ) අදාළ දීමනාව පෙරාතුව ම වූ දිනයෙහි, යම් සේවා යෝජකයකු විසින් මේ පනතේ සඳහන් කර්මාන්ත අතුරින් යම් කර්මාන්තයක හෝ වෙනත් යම් ඕනෑම සේවාස්ථානයක ඒ සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති නුපුහුණු සේවකයකු ද ඇතුළුව සෑම සේවකයකුට ඒ සේවායෝජකයාගේ සේවකයකු වශයෙන් ඔහු නොකඩවා සේවය කරන තාක් කල්, අදාළ දිනයට පෙරතුව ම වූ දිනයෙහි ඒ සේවකයා භුක්ති විඳිමින් සිටි, නමුත් මහජන ආරක්ෂක ආඥා පනතේ 5 වන වගන්තිය යටතේ සාදන ලද හදිසි අවස්ථා නියෝග යටතේ ඔහුට ගෙවනු ලැබූ යම් දීමනා නොවන වැටුප්වලට, දීමනාවලට හෝ කවර නාමයකින් හෝ අභිධානයකින් හෝ හඳුන්වනු ලබන මුදලින් කරන ලද වෙනත් ගෙවීම්වලට අදාළ නියම හා කොන්දේසිවලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි මත, ඒ සේවා යෝජකයා විසින් එසේ නොකඩවා සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු අතර, මේ පනතේ ඉහත සඳහන් විධිවිධාන යටතේ ගෙවිය යුතු දීමනා එම වැටුප්වල දීමනාවලට හෝ වෙනත් ගෙවීම්වලට අතිරේකව විය යුතු ය.

6. (1) යම් කර්මාන්තයක සේවකයකුගේ සේවායෝජකයකු විසින්, ඒ කර්මාන්තයේ සේවයෙහි නියුක්ත කරගෙන ඇති සේවකයන් සම්බන්ධයෙන්-

(අ) සේවයෙහි නියුක්ත කර ගෙන ඇති එක් එක් සේවකයාගේ නම;

(ආ) ඒ එක් එක් සේවකයා විසින් ඉටු කරනු ලබන වැඩයේ වර්ගය; සහ

(ඇ) මේ පනතේ විධිවිධානවලට අනුව ඒ එක් එක් සේවකයාට ගෙවනු ලබන මුදල දැක්වෙන ලේඛනයක්, ඒ කර්මාන්තය පවත්වාගෙන යනු ලබන්නේ නම් යම් ස්ථානයක ද ඒ ස්ථානයෙහි තබාගෙන පවත්වා ගෙන යා යුතු ය.

(2) සේවා යෝජකයකු වශයෙන් (1) වන උපවගන්තිය යටතේ යම් වාර්තාවක් පවත්වාගෙන යන්නා වූ හෝ පවත්වාගෙන ගිය හෝ සෑම තැනැත්තෙකුම, මේ පනත යටතේ එම වාර්තා පවත්වා ගෙන යාමට නියම වූයේ යම් දිනයක සිට ද ඒ දිනයෙහි සිට අවුරුදු හතරක කාලයක් එම වාර්තා සුරක්ෂිතව තබා ගත යුතු අතර, පරීක්ෂා කිරීම සඳහා එම වාර්තා ඉදිරිපත් කරන ලෙස සහ එම වාර්තාවේ සත්‍ය පිටපතක් සපයන ලෙස හෝ එවැනි පිටපතක් සාදා ගැනීමට ඉඩ සලසන ලෙස හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබූ විට, එසේ කළ යුතු ය.

7. නිසි බලධරයාට— නිසි බලධරයාගේ බලතල.

(අ) යම් ලේඛනයක් හෝ වේතන පිළිබඳ වාර්තාවක් පරීක්ෂා කිරීමේ හෝ මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ දැයි නිසැකවම දැන ගැනීමේ කාර්යය සඳහා හෝ මේ පනතෙහි සඳහන් සේවකයින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින යම් ස්ථානයකට, දිවා හෝ රාත්‍රී කාලයේ සියලු යුක්ති සහගත වේලාවන්හි දී ඇතුළුවී එම ස්ථානය පරීක්ෂා කිරීමට; හෝ

(ආ) තමා එම ස්ථානය පරීක්ෂා කරන විට පරීක්ෂා කිරීම සඳහා එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, ඒ ලේඛනය හෝ වාර්තාව

නියමිත පසු දිනයක දී පරීක්ෂා කිරීම සඳහා ඒ ස්ථානයේ දී හෝ තම කාර්යාලයේ දී ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට; හෝ

(ඇ) එවැනි යම් සම්පූර්ණ ලේඛනයක හෝ වාර්තාවක හෝ එහි යම් කොටසක හෝ පිටපත් ගැනීමට; හෝ

(ඈ) එම සේවා ස්ථානයේ දී තමාට දක්නට ලැබෙන්නා වූ ද, ඒ ස්ථානයෙහි පවත්වා ගෙන යනු ලබන යම් කර්මාන්තයක යෙදී සිටින සේවායෝජකයකු යයි නැතහොත් ඒ ස්ථානයෙහි පවත්වා ගෙන යනු ලබන යම් කර්මාන්තයක හෝ වෙනත් ඕනෑම සේවාස්ථානයක සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති සේවකයකු යයි විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇත්තා වූ ද යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමට; හෝ

(ඉ) මේ පනත අදාළ වන යම් සේවායෝජකයකුට-

(i) එවැනි යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින සියළුම සේවයකයින්ට හෝ ඒ සේවකයින්ගෙන් සමන්විත යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අදාළ වන්නා වූ ද මේ පනතේ කාර්ය සඳහා තමා විසින් නියම කරනු ලබන විස්තර ඇතුළත් වන්නා වූ ද වාර වාර්තාවක් ;

(ii) එවැනි යම් සේවායෝජකයකු විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක සඳහන් යම් විස්තර සම්බන්ධයෙන් තමා නියම කරන තොරතුරක් හෝ පැහැදිලි කිරීමක් හෝ;

(iii) එවැනි යම් සේවායෝජකයකු විසින් පවත්වාගෙන යනු ලබන යම් සම්පූර්ණ ලේඛනයක හෝ වාර්තාවක හෝ එහි යම් කොටසක සත්‍ය පිටපතක් නිශ්චිත දිනක දී හෝ ඉන් පෙර තමා වෙත සපයන ලෙස ලියවිල්ලකින් විධාන කිරීමට බලය ඇත්තේ ය.

වැරදි හෝ දණ්ඩන.

**8.** අදාළ දිනයෙහි හෝ ඉන් පසුව—

(අ) 6 වන වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින ; හෝ

(ආ) 7 වන වගන්තිය යටතේ යම් ඇතුළුවීමක් හෝ පරීක්ෂා කිරීමක් සඳහා හෝ නිසි බලධරයාගේ බලපත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා හෝ අවශ්‍ය ලෙස ඔහුට වුවමනා වන්නා වූ විධි සැලසීම පැහැර හරින; හෝ

(ඇ) 7 වන වගන්තියෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ බලධරයාට බාධා කරන හෝ හිරිහැර කරන; හෝ

(ඈ) 7 වගන්තියෙන් පවරා ඇති බලතල යටතේ ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස ඒ බලධරයා තමාට නියම කරන යම් ලේඛනයක් හෝ වේතන පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ඉ) යම් වැදගත් විස්තරයක් සම්බන්ධයෙන් සාවද්‍ය වන්නා වූ යම් ලේඛනයක් හෝ වේතන පිළිබඳ වාර්තාවක් පිළියෙල කරන හෝ පිළියෙල කරනු ලැබීමට සළස්වන නැතහොත් 7 වන වගන්තියෙන් පවරා ඇති බලතල යටතේ ක්‍රියා කරන එම බලධරයා වෙත යම් ලේඛනයක් හෝ වාර්තාවක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කරනු ලැබීමට සලස්වන නැතහොත් දැන දැනම ඉදිරිපත් කරනු ලැබීමට ඉඩ හරින; හෝ

(ඊ) 7 වන වගන්තිය යටතේ එම බලධරයා විසින් දෙන ලද යම් විධානයක් අනුව ක්‍රියාකිරීම පැහැර හරින හෝ එකී 7 වන වගන්තිය යටතේ වාර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට, සාවද්‍ය වාර වාර්තාවක් හෝ යම් සාවද්‍ය ප්‍රකාශයක් ඇතුළත් වාර වාර්තාවක් හෝ දැන දැනම ඉදිරිපත් කර හෝ සපයන හෝ ඉදිරිපත් කරනු ලැබීමට සළස්වන සෑම තැනැත්තෙකු ම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ

දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

සේවා නියුක්තිය අබන්ධව පැවැතීම සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

**9.** 3 වන වගන්තිය යටතේ සේවකයකුට ලැබිය යුතු යම් මුදලක් යම් ලිඛිත නීතියක සියලු කාර්ය සඳහා හෝ නොඑසේනම් ඔහුගේ වේතනවල කොටසක් බව සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එවැනි සේවකයකුගේ සෑම සේවායෝජකයකු විසින් ම එම සේවකයාගේ වේතන ගෙවීමට තමා යටත් වන කාලපරිච්ඡේදය ඇතුළත එම මුදල ගෙවිය යුතු ය.

සේවකයන්ට ලැබිය යුතු මුදල් ගෙවීම් පැහැර හැරීම ඇතැම් අවස්ථාවල සේවකයන්ට ලැබිය යුතු මුදල් අයකර ගැනීම.

**10.** (1) මේ පනත යටතේ තමගේ සේවකයකුට ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබ ඇති මුදලක් ගෙවීම පැහැර හරින යම් සේවායෝජකයකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ යම් සේවායෝජකයකුගේ සේවකයකුට ගෙවිය යුතු නියම කරනු ලැබ ඇති යම් මුදලක් ගෙවීම ඒ සේවායෝජකයා පැහැර හැරීම හේතුවෙන් වූ වරදක් සම්බන්ධයෙන් ඒ සේවායෝජකයා මහේස්ත්‍රාත් අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අධිකරණය විසින්, එම වරද සඳහා ඒ අධිකරණය විසින් නියම කළ හැකිව තිබූ වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, ආඥාවේ සඳහන් කාලයක් ඇතුළත ඒ මුදල ඒ සේවකයාට ගෙවන ලෙස සේවායෝජකයාට ආඥා කරනු ලැබිය හැකිය. තව ද, ඒ මුදල එසේ නොගෙවනු ලැබුවහොත් ඒ මුදල අධිකරණය විසින් නියම කරනු ලද දඩයක් මෙන් අධිකරණයේ ආඥාව පිට අයකර ගනු ලැබ ඒ සේවකයාට ගෙවනු ලැබිය හැකි ය.

නියෝග.

**11.** (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයේ දී හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ යම් දිනක ද, ඒ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ ලැබිය යුතු ගෙවීම් සේවකයකුගේ වේතන හෝ වැටුප්වල කොටසක් විය යුතු බව.

**12.** මෙම පනතේ දීමනාව—

(අ) සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල හා අදාළ විශ්‍රාම අරමුදල්;

(ආ) වාර්ෂික නිවාඩු පාරිශ්‍රමික;

(ඇ) අතිකාල දීමනා;

(ඈ) මාතෘ ප්‍රතිලාභ ගෙවීම්; සහ

(ඉ) පාරිතෝෂික.

සඳහා සේවකයින්ගේ වැටුප් හා පාරිශ්‍රමික ගනයේ දී අන්තර්ගත හා අදාළ ලෙස සැලකිය යුතු වේ. මෙම පනත අදාළවන සෑම සේවකයකුගේ සේවායෝජකයකුම එකී සේවකයාට යම් ලිඛිත නීතියක් යටතේ එකී වැටුප් හා පාරිශ්‍රමික ගෙවිය යුතු යැයි නියම කර ඇති කාල සීමාව තුළදී මෙම දීමනාව ගෙවීම සිදු කළ යුතු වේ.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස ඒ පනතෙහි— අර්ථ නිරූපනය.

"සාමුහික ගිවිසුම" යන්නෙහි කාර්මික ආරවුල් පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය. (131 පරිච්ඡේදය)

"කොමසාරිස්වරයා" යන්නෙන් තත් කාලයෙහි කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ සහකාර කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ කම්කරු නිලධාරියකු වශයෙන් හෝ තත් කාලයෙහි ධුරය දරන යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ.

"සමුපකාර සමිතිය" යන්නෙන් 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරන ලදැයි සලකනු ලබන සමුපකාර සමිතියක් අදහස් වේ.

"මූලික වැටුප" යන්නෙන් අතිකාල දීමනා සහ අනෙකුත් සියලු අමතර දීමනා හැර දිනකට පැය අටක් සේවය කරන ලදැයි සලකා එක් මාසයක සේවය කරන ලද දින ගණන අනුව ගණනය කරන ලද මුදල අදහස් වේ. කෑලි ප්‍රමාණය යටතේ හෝ සේවය කරන ලද කාල පරිච්ඡේදය සලකමින් වැටුප ගණනය වන සේවකයින් සඳහා, අතිකාල දීමනා සහ අනෙකුත් සියලු අමතර දීමනා හැර දිනකට පැය අටක් සේවය කරන ලදැයි සලකා එක් මාසයක සේවය කරන ලද දින ගණන අනුව ගණනය කරන ලද වැටුප, මූලික වැටුප සේ සලකනු ලබයි.

"ඉපයීම්" යන්නෙහි 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

"සේවායෝජකයා" යන්නෙන් යම් කර්මාන්තයක, ඕනෑම සේවස්ථානයක තමා වෙනුවෙන් යම් සේවකයකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තෙක් හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් යම් සේවකයකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තෙකු වෙනුවෙන් ද, ඒ තැනැත්තා හෝ අදහස් වන අතර යම් කර්මාන්තයක වෙනත් යම් තැනැත්තෙකු වෙනුවෙන් යම් සේවකයකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තෙකු විසින් ද ඒ තැනැත්තා ද ඊට ඇතුළත් වේ.

"කර්මාන්තය" යන්නට සේවායෝජයකු විසින් හෝ සේවකයකු විසින් හෝ පවත්වාගෙන යනු ලබන, ඉටු කරනු ලබන හෝ කරගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, ව්‍යාපෘතියක්, වෘත්තියක්, වෘත්තීය සමිතියක් ගෘහ සේවක පරිශ්‍රයක් හෝ ජීවනෝපායක් සහ යම් කර්මාන්තයක යම් අංශයක් හෝ එබන්දක යම් කටයුත්තක් හෝ ක්‍රියාවලියක් ඇතුළත් වන නමුත්, සේවායෝජයකුගේ තත්වයෙන් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් ම ප්‍රග්ධනය සපයනු ලැබූ යම් සංස්ථාගත හෝ සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් විසින් පවත්වගෙන යනු ලබන හෝ ප්‍රදාන වශයෙන් බාලාපරාධකරුවන්ට හෝ අනත් දරුවන්ට හෝ අසරණ, ගොළු, බිහිරි හෝ අන්ධ තැනැත්තාට කාර්මික පුහුණුවක් ලබාදීමේ කාර්ය සඳහා පවත්වාගෙන යනු ලබන යම් කාර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක් හා 2015 සංශෝධිත අතුරු රාජ්‍ය අයවැය යටතේ අනිවාර්ය වැටුප් වැඩිවීමක් අදාලවන ආයතනයක් ඊට ඇතුළත් නොවේ; තවද,

"සේවකයා" යන්නෙන් යම් කර්මාන්තයක, කාර්මික ව්‍යාපාරයක, වෙළඳ ව්‍යාපාරයක, ව්‍යාපෘතියක, ගෘහ ආශ්‍රිත පරිශ්‍රයක හෝ ජීවනෝපායක යම් වැඩක් වාචික වූ හෝ ලිඛිත වූ හෝ ප්‍රකාශිත වූ හෝ ගම්‍යමාන වූ හෝ ගිවිසුමක් යටතේ කිරීමට යම් සේවා යෝජයකු විසින් සේවයෙ හි නියුක්ත කර ඇති තැනැත්තෙකු අදහස් වන අතර, එයට යම් ලිඛිත නීතියක් හෝ,

අන්‍යාකාරයකින් වැටුප් හෝ වේතන විධිමත් කරනු ලැබූ සේවකයකු සහ කෑලි ප්‍රමාණය අනුව ගෙවීමට සේවයෙහි නියුක්ත කර ඇති සේවකයකු ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වේ.

14. මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.